**විල්ගමුව ප්‍රාදේශීය සභාව.**

**---------------------------------**

**මාතලේ දිස්ත්‍රික්කය.**

**-----------------------------**

1. මූල්‍ය ප්‍රකාශන

----------------

1.1 මූල්‍ය ප්‍රකාශන ඉදිරිපත් කිරීම

---------------------------------

2017 වර්ෂයේ මූල්‍ය ප්‍රකාශන 2018 මැයි 01 දින විගණනයට ඉදිරිපත් කර තිබූ අතර එම මූල්‍ය ප්‍රකාශන පිළිබඳ විගණකාධිපතිවරයාගේ වාර්තාව 2018 ජූලි 11 දින සභාපතිවරයාට යවා ඇත.

1.2 තත්ත්වාගණනය කළ මතය

-------------------------------

මෙම වාර්තාවේ 1.3 ඡේදයේ දක්වා ඇති කරුණුවලින් වන බලපෑම හැර, මූල්‍ය ප්‍රකාශන වලින් 2017 දෙසැම්බර් 31 දිනට විල්ගමුව ප්‍රාදේශීය සභාවේ මූල්‍ය තත්ත්වය සහ එදිනෙන් අවසන් වර්ෂය සඳහා එහි මූල්‍ය ක්‍රියාකාරීත්වය පොදුවේ පිළිගත් ගිණුම්කරණ මූලධර්ම වලට අනුකූලව සත්‍ය හා සාධාරණ තත්ත්වයක් පිළිඹිබු කරන බව මා දරන්නා වූ මතය වේ.

1.3 මූල්‍ය ප්‍රකාශන පිළිබඳ අදහස් දැක්වීම

-----------------------------------------

1.3.1 ගිණුම්කරණ අඩුපාඩු

-----------------------

පහත සඳහන් ගිණුම්කරණ අඩුපාඩු විගණනයේදී නිරීක්ෂණය විය.

(අ) ස්ථාවර වත්කම්වල එකතුව හා ප්‍රාග්ධන යෙදුමට ආදායමෙන් දායකවීමේ ගිණුමේ ශේෂය අතර රු.1,471,340 ක වෙනසක් විය.

(ආ) සමාලෝචිත වර්ෂයේ මිලදී ගෙන තිබූ රු.182,275 ක් වටිනා අයිතම 08 ක් ස්ථාවර වත්කම් වශයෙන් හඳුනා නොගෙන වියදම් වශයෙන් දක්වා තිබීම හේතුවෙන් ස්ථාවර වත්කම් ගිණුම එම ප්‍රමාණයෙන් අඩුවෙන්ද මෙහෙයුම් වියදම් එම ප්‍රමාණයෙන් වැඩියෙන්ද දක්වා තිබුණි.

(ඇ) හෙට්ටිපොල පොදු වැසිකිළිය සංවර්ධන කටයුතු වෙනුවෙන් ගෙවන ලද රු.300,000 ක මුදලක් ස්ථාවර වත්කම් වශයෙන් ගිණුම්ගතකර නොතිබුණි.

(ඈ) 2017 වර්ෂයේ ලිපිද්‍රව්‍ය මිලදී ගැනීම වෙනුවෙන් 2018 වර්ෂයේ ගෙවන ලද රු.109,590 ක මුදලක් 2017 වර්ෂයේ ණයහිමියන් යටතේ දක්වා නොතිබුණි.

(ඉ) විල්ගමුව මහජන බැංකුවේ තැන්පත්කර තිබූ ස්ථාවර තැන්පතු 03 ක් සඳහා 2017 වර්ෂයට අදාළ පොළී ආදායම රු.86,237 ක් වුවද එය රු.130,849 ක් වශයෙන් දක්වා තිබීම හේතුවෙන් පොළී ආදායම හා වාර්ෂික අතිරික්තය රු.44,612 ක් වැඩියෙන් දක්වා තිබුණි.

1.3.2 නොසැසඳුණු ගිණුම්

-----------------------

මූල්‍ය ප්‍රකාශනවල දැක්වෙන එකතුව රු.33,926,681 ක් වූ ගිණුම් විෂයන් 04 කට අදාළ ශේෂයන් සහ ඒවාට අදාළ උපයෝගී ලේඛන හා වාර්තාවල දැක්වෙන ශේෂයන් අතර වෙනස්කම් පැවති අතර නිරීක්ෂණය වූ අසමානතාවල එකතුව රු.559,743 ක් විය.

1.3.3 අවිනිශ්චිත ගිණුම

ඉකුත් වර්ෂය අවසානයට රු.760,894 ක් වූ අවිනිශ්චිත ගිණුමේ හර ශේෂයට සමාලෝචිත වර්ෂයේදී රු.3,829,878 ක් බැර කිරීම හේතුවෙන් වර්ෂය අවසානයට බැර ශේෂය රු.3,068,984ක් වූ අතර වර්ෂ ගණනාවක සිට මූල්‍ය ප්‍රකාශනවල නොකඩවා පෙන්නුම් කරන අවිනිශ්චිත ගිණුමේ ශේෂය නිවැරදි කිරීමට කටයුතුකර නොතිබුණි.

1.3.4 ලැබිය යුතු හා ගෙවිය යුතු ගිණුම්

(අ) ලැබිය යුතු ගිණුම්

දීර්ඝ කාලයක් තිස්සේ මූල්‍ය ප්‍රකාශනවල නොවෙනස්ව ඉදිරියට ගෙනෙමින් පවතින එකතුව රු.910,704 ක් වූ ලැබිය යුතු ගිණුම් ශේෂ 05 ක වටිනාකම නිරවුල් කර ගැනීමට සමාලෝචිත වර්ෂයේදී ද කටයුතු කර නොතිබුණි.

(ආ) ගෙවිය යුතු ගිණුම්

හිඟහිටි ප්‍රාග්ධන ආධාර වශයෙන් රු. 2,383,801 ක බැර ශේෂයක් දීර්ඝ කාලයක් තිස්සේ මූල්‍ය ප්‍රකාශනවල දක්වා තිබුණු අතර මෙම ගිණුම් ශේෂය හඳුනාගෙන නිරවුල් කිරීමට කටයුතු කර නොතිබුණි.

1.3.5 විගණනය සඳහා අවශ්‍ය ලිඛිත සාක්ෂි නොවීම

අවශ්‍ය තොරතුරු ඉදිරිපත් නොකිරීම නිසා එකතුව රු. 69,370,711 ක් වූ ගිණුම් විෂයයන් 09 ක් විගණනයේදී සතුටුදායක ලෙස සත්‍යාපනය කිරීමට නොහැකි විය.

1.3.6 අනුකූල නොවීම්

නීති, රීති, රෙගුලාසි හා කළමනාකරණ තීරණවලට අනුකූල නොවීම්

නීති, රීති, රෙගුලාසි හා කළමනාකරණ තීරණවලට අනුකූල නොවූ අවස්ථා පහත දැක්වේ.

| නීති, රීති, රෙගුලාසි හා කළමනාකරණ තීරණවලට යොමුව | වටිනාකම | අනුකූල නොවීම |
|---|---|---|
| | රු. | |
| (අ) 1987 අංක 15 දරන ප්‍රාදේශීය සභා පනතේ 24 වගන්තිය | | සභාව විසින් ඉදිකර ඇති මාර්ග ගැසට් කිරීමට කටයුතු කර නොතිබුණි. |
| (ආ) 1988 ප්‍රාදේශීය සභා (මූල්‍ය හා පරිපාලන) රීති මාලාව | | |
| i. 178(2)(2)(ඉ) වගන්තිය | 52,950 | මිලදී ගැනීම් සඳහා මිල ගණන් කැඳවීමේදී අදාළ පිරිවිතර සඳහන් කළ යුතු වුවද පිරිවිතර සඳහන් කිරීමකින් තොරව භාණ්ඩ මිලදී ගෙන තිබුණි. |

| | | | |
|---|---|---|---|
| | ii. 217 රීතිය | - | සභාව සතු හා සභාව විසින් ප්‍රයෝජනයට ගන්නා සියලුම ඉඩම් හා ගොඩනැගිලි පිළිබඳව P.S 46 ආකෘතිය ප්‍රකාරව ලේඛනයක් යාවත්කාලීනව පවත්වා නොතිබුණි. |
| (ඇ) | 2000 අංක 53 හා 1988 අංක 56 දරන පනත්වලින් සංශෝධිත 1980 අංක 47 දරන ජාතික පාරිසරික පනත සහ ඒ යටතේ පනවන ලද රෙගුලාසිවලට අනුවකූලව නිකුත්කළ අංක 1523/16 දරන 2008 ක්වූ ජනවාරි 25 දිනැති අති විශේෂ ගැසට් පත්‍රයේ "ඇ" කොටස | - | පරිසර ආරක්ෂණ බලපත්‍ර ලබාගත යුතු වියළි ක්‍රියාවලි සහිත වී මෝල් හා වාණිජ ඇඹරුම්හල් 15 ක් සඳහා හා කොන්ක්‍රීට් වැඩපල 08 ක් සඳහා පරිසර ආරක්ෂණ බලපත්‍ර ලබාදී නොතිබුණි. |
| (ඈ) | 2009 අප්‍රේල් 16 දිනැති 09/2009 දරන රාජ්‍ය පරිපාලන චක්‍රලේඛය | - | සියලුම රාජ්‍ය ආයතනවල ඇඟිලි සළකුණු සටහන් කිරීමේ යන්ත්‍ර මගින් පැමිණීම හා පිටවීම සනාථ කිරීම සිදුකළ යුතු වුවත් ප්‍රාදේශීය සභාව විසින් එපරිදි කටයුතු කර නොතිබුණි. |

2 මූල්‍ය සමාලෝචනය

---------------------

2.1 මූල්‍ය ප්‍රතිඵල

-----------------

ඉදිරිපත් කරන ලද මූල්‍ය ප්‍රකාශන අනුව 2017 දෙසැම්බර් 31 දිනෙන් අවසන් වර්ෂය සඳහා සභාවේ පුනරාවර්තන වියදම ඉක්මවූ ආදායම රු.7,323,775 ක් වූ අතර ඊට අනුරූපීව ඉකුත් වර්ෂයේ පුනරාවර්තන වියදම ඉක්මවූ ආදායම රු.7,553,765 ක් විය.

2.2 ආදායම් පරිපාලනය

----------------------

2.2.1 ඇස්තමේන්තුගත ආදායම්, බිල් කළ ආදායම්, රැස් කළ ආදායම් හා හිඟ ආදායම්

--------------------------------------------------------------------------------

සමාලෝචිත වර්ෂයට හා ඉකුත් වර්ෂයට අදාළව ඉදිරිපත් කර තිබූ ඇස්තමේන්තුගත ආදායම්, බිල් කළ ආදායම්, රැස් කළ ආදායම් හා හිඟ ආදායම් පිළිබඳ තොරතුරු පහත දැක්වේ.

| ආදායම් ප්‍රභවය | 2017 | | | | 2016 | | | |
|---|---|---|---|---|---|---|---|---|
| | ඇස්තමේන්තු ගත ආදායම | බිල් කළ ආදායම | රැස් කළ ආදායම | දෙසැම්බර් 31 දිනට මුළු හිඟය | ඇස්තමේන්තු ගත ආදායම | බිල් කළ ආදායම | රැස් කළ ආදායම | දෙසැම්බර් 31 දිනට මුළු හිඟය |
| | රු. | රු. | රු. | රු. | රු. | රු. | රු. | රු. |
| වරිපනම් හා බදු | 745,000 | 637,907 | 483,299 | 154,608 | 745,000 | 637,000 | 760,704 | - |
| කුලී | 3,025,000 | 1,764,664 | 2,434,076 | - | 1,985,000 | 1,449,600 | 2,165,386 | - |
| බලපත්‍ර ගාස්තු | 1,435,000 | 671,959 | 1,201,090 | - | 1,410,000 | 815,355 | 1,276,335 | - |
| වෙනත් ආදායම් | 8,251,000 | 1,856,037 | 3,876,449 | - | 10,132,000 | 1,877,332 | 3,576,602 | - |
| | 13,456,000 | 4,930,567 | 7,994,914 | 154,608 | 14,272,000 | 4,779,287 | 7,779,027 | - |

### 2.2.2 ආදායම් රැස්කිරීමේ කාර්යසාධනය

සභාව විසින් ආදායම් වර්ධනය කරගැනීමට කටයුතු නොකිරීම හේතුවෙන් 2016 වර්ෂයේ රු.13,925,162 ක් වූ වෙනත් ආදායම් සමාලෝචිත වර්ෂයේදී රු.12,763,817 ක් දක්වා රු.1,161,345 කින් හෙවත් සියයට 8 කින් අඩුවී තිබුණි.

### 2.2.3 වරිපනම් හා බදු

පහත සඳහන් කරුණු නිරීක්ෂණය විය.

(අ) සමාලෝචිත වර්ෂයේ දෙසැම්බර් 31 දිනට හිඟහිටි වරිපනම් බදු ශේෂය රු.302,737 ක් වූ අතර සමාලෝචිත වර්ෂයේ බිල්කළ වරිපනම් බදු ප්‍රමාණය රු.637,907 ක් විය. එයින් 2017 වර්ෂයට අදාළව ලැබී තිබුණේ සියයට 73 ක් වන රු.467,483 ක් පමණක් වීමෙන් වරිපනම් බදු අයකිරීම දුර්වල මට්ටමක පැවතුණි.

(ආ) වරිපනම් දේපළ නව තක්සේරුවකට ලක්කර සභාවේ ආදායම් වර්ධනය කරගැනීමට කටයුතු කළ යුතු වුවත් 2011 වර්ෂයෙන් පසු වරිපනම් ගාස්තු සංශෝධනයකට ලක්කර නොතිබුණි.

(ඇ) ප්‍රාදේශීය සභා බල ප්‍රදේශයේ පිහිටි රාජ්‍ය ආයතනවලින් අයවිය යුතු හිඟ වරිපනම් රු.118,943 ක් වර්ෂ 08 ක් ගතවී ඇතත් අයකර ගැනීමට කටයුතු කර නොතිබුණි.

### 2.2.4 කුලී

වර්ෂ ගණනාවක සිට අයවිය යුතුව පවතින හිඟ මස්කඩ කුලී රු.236,253 ක් හිඟ කඩ කුලී රු.660,816 ක් හා මුහුදු මාළු කඩ කුලී රු.3,000 ක් ද වශයෙන් එකතුව වටිනාකම රු.900,069 ක බදු කුලී අයකර ගැනීමට සමාලෝචිත වර්ෂය තුළදී ද කටයුතු කර නොතිබුණි.

2.2.5 වෙනත් ආදායම්

-----------------

පහත සඳහන් කරුණු නිරීක්ෂණය විය.

(අ) සභා බල ප්‍රදේශයේ ත්‍රීවිල් රථ නැවතුම්පළවල් පවතින ස්ථාන හඳුනාගෙන නොතිබුණු අතර එම නැවතුම්පළවල් පවතින ඉඩම්වල අයිතිය සභාවට පවරා නොගැනීම හේතුවෙන් මෙම ස්ථානවලින් ගාස්තු අයකර ගැනීමට නොහැකි වී තිබුණි.

(ආ) සභා බල ප්‍රදේශයේ පිහිටි සන්නිවේදන කුලුනු හඳුනාගෙන වාර්ෂික ගාස්තු අයකර ගැනීමට සභාව විසින් කටයුතු කර නොතිබුණි.

(ඇ) සමාලෝචිත වර්ෂය අවසානයට හිඟ ජල ගාස්තු ලෙස රු.898,385 ක් අයවිය යුතුව තිබුණි.

(ඈ) සභා බල ප්‍රදේශයේ පිහිටි රාජ්‍ය ආයතනවලින් 2008 වර්ෂයේ සිට හිඟ ජල ගාස්තු වශයෙන් රු.50,429 ක් අයවිය යුතුව තිබුණි.

2.2.6 උසාවි දඩ හා මුද්දර ගාස්තු

-----------------------------

පළාත් සභාවේ ප්‍රධාන ලේකම්වරයාගෙන් සහ අනෙකුත් බලධාරීන්ගෙන් 2017 දෙසැම්බර් 31 දිනට ලැබිය යුතුව තිබූ උසාවි දඩ රු.1,654,882 ක් හා මුද්දර ගාස්තු රු.28,400 ක් විය.

3. මෙහෙයුම් සමාලෝචනය

----------------------------

3.1 කාර්යසාධනය

----------------

ප්‍රාදේශීය සභා පනතේ 3 වන වගන්තිය යටතේ මහජන සෞඛ්‍ය, පොදු උපයෝගිතා සේවා සහ පොදු මංමාවත් පිළිබඳ කාරණා විධිමත් කිරීම හා පාලනය කිරීම, ජනතාවගේ සුබ විහරණය, පහසුව හා සුභසාධනය යන සභාව විසින් ඉටු කළයුතුව තිබුණු කර්තව්‍යයන් ඉටු කිරීම පිළිබඳව අනාවරණය වූ කරුණු පහත දැක්වේ.

(අ) අතුරු ව්‍යවස්ථා

------------------

ප්‍රාදේශිය සභා පනතේ 126 වගන්තිය යටතේ ප්‍රධාන කාරණා 30 ක් ඉටුකිරිම සඳහා අතුරු ව්‍යවස්ථා පැනවිය යුතුව තිබූ නමුත් 2017 දෙසැම්බර් 31 දින වන විටත් කාරණා 18 ක් වෙනුවෙන් පමණක් අතුරු ව්‍යවස්ථා පනවා තිබුණි.

(ආ) ක්‍රියාකාරී සැලැස්ම

---------------------

2014 පෙබරවාරි 02 දිනැති අංක 01/2014 දරන රාජ්‍ය මුදල් චක්‍රලේඛය ප්‍රකාරව වාර්ෂික ක්‍රියාකාරකම් සඳහා වන අක්මුදල් අවශ්‍යතා සැලැස්ම, සැලසුම් කර ඇති ප්‍රධාන සංවර්ධන වැඩසටහන් සැලැස්ම, වාර්ෂික ක්‍රියාකාරකම් සැලැස්ම හා එම ක්‍රියාකාරකම්වල අපේක්ෂිත නිමවුම් ඇතුළත් කරමින් වාර්ෂික ක්‍රියාකාරී සැලැස්ම පිළියෙල කර නොතිබුණි.

(ඇ) ඝණ අපද්‍රව්‍ය කළමනාකරණය

----------------------------------

සමාලෝචිත වර්ෂය තුළ ඝන අපද්‍රව්‍ය බැහැර කිරීම සහ කළමනාකරණය වෙනුවෙන් වැටුප් ඇතුළුව වෙනත් වියදම් වශයෙන් රු.2,792,877 ක මුදලක් දරා තිබුණද ප්‍රාදේශීය සභා බල

ප්‍රදේශයේ දෛනිකව එකතු වන කසළ මෙට්‍රික් ටොන් 01 කට ආසන්න ප්‍රමාණයක් වර්ග කිරීමකින් තොරව එකතු කර රජයේ ඉඩමකට බැහැර කර තිබුණි.

(ඇ) පාරිසරික ගැටළු

------------------

ප්‍රාදේශීය සභා බල ප්‍රදේශයේ දෛනිකව එකතු වන පොලිතීන් කසළ බැහැර කරන ස්ථානයේම වළක් කපා පිලිස්සීමට කටයුතු කර තිබුණු නමුත් පොලිතීන් විශාල ප්‍රමාණයක් අදාළ භූමියේ එකතු වී තිබුණු අතර මෙම පොලිතින් සතුන්ගේ ආහාර බවට පත්ව තිබුණි. පොලිතින් හා දිරන කසළ වර්ග කිරීමෙන් තොරව එකතු කර එකම ස්ථානයකට බැහැර කිරීම හේතුවෙන් අවට පරිසරය අපිරිසිදු තත්ත්වයට පත්වී තිබුණු අතර ඝන අපද්‍රව්‍ය කළමනාකරණය සම්බන්ධයෙන් දීර්ඝ කාලීනව වැඩපිළිවෙලකට අවශ්‍ය මූලික ක්‍රියාමාර්ග ගැනීමටද සභාව විසින් කටයුතු කර නොතිබුණි.

(ඉ) තිරසර සංවර්ධන ඉලක්ක

----------------------------

තිරසර සංවර්ධනය සඳහා වන 2030 න්‍යාය පත්‍රයේ තිරසර සංවර්ධන අරමුණු ඉලක්ක 17 ක් ළඟාකරගැනීම වෙනුවෙන් සියලු රාජ්‍ය ආයතන කටයුතු කළ යුතු වුවත් ප්‍රමාණවත් පරිදි තිරසර සංවර්ධන අරමුණු හා ඉලක්ක හඳුනාගෙන ක්‍රියාකාරී සැලැස්ම තුළින් ක්‍රියාත්මක කිරීමට සුදුසු වැඩපිළිවෙලක් ක්‍රියාත්මක කර නොතිබුණි.

3.2 කළමනාකරණ අකාර්යක්ෂමතා

------------------------------------

ප්‍රාදේශීය සභාවට අයත් වාහන 05 ක් සඳහා වාහන ආදායම් බලපත්‍ර නියමිත කාලය තුළ ලබා නොගැනීම හේතුවෙන් 2013 හා 2017 වර්ෂ වලදී රු.9,470 ක් දඩ වශයෙන් ගෙවා තිබුණි.

3.3 මානව සම්පත් කළමනාකරණය

-----------------------------------

(අ) සේවක පුරප්පාඩු හා අතිරික්ත

--------------------------------

සමාලෝචිත වර්ෂයේ දෙසැම්බර් 31 දින වන විට සභාවේ කාර්ය මණ්ඩල පුරප්පාඩු 19 ක් පැවති අතර මෙම පුරප්පාඩු 15 න් 13 ක්ම ද්විතික මට්ටමේ කාර්ය මණ්ඩලය වීමෙන් සභාවේ කටයුතු කාර්යක්ෂමව ඉටුකිරීමේ ගැටලු සහගත බවක් දක්නට ලැබුණි.

(ආ) සේවක ණය

--------------

2006 වර්ෂයේ සිට සභාවේ සේවය කොට විශ්‍රාම ගිය, මිය ගිය හා ස්ථාන මාරුවී ගිය නිලධාරීන් 07 දෙනෙකුගෙන් අයනොවී තිබූ රු.91,141 ක සේවක ණය අයකර ගැනීමට ක්‍රියාමාර්ග ගෙන නොතිබුණි.

3.4 මෙහෙයුම් අකාර්යක්ෂමතා

-----------------------------

පහත සඳහන් කරුණු නිරීක්ෂණය විය.

(අ) ප්‍රාදේශීය සභාව සතු හෙට්ටිපොල නගරයේ පොදු වැසිකිළිය ප්‍රාදේශීය සභාව විසින් හෝ කම්කරුවෙකු යොදා මහජන භාවිතය සඳහා ලබාදීමට කටයුතු කර නොතිබුණු අතර නඩත්තු කිරීම පමණක් සිදුකරමින් තිබුණි. මේ හේතුවෙන් සභාවට ආදායම් උත්පාදන මාර්ගයක් අහිමිව තිබූ අතර සමාලෝචිත වර්ෂයේදී පළාත් නිශ්චිත සංවර්ධන ප්‍රදාන යටතේ රු.300,000

ක් යොදා මෙම වැසිකිළිය සංවර්ධනය කර තිබුණද මහජනතාවට ප්‍රයෝජනයට ගැනීමට හැකි පරිදි එම ස්ථානය පවත්වාගෙන යාමට සභාව විසින් කටයුතු කර නොතිබුණි.

(ආ) පළාත් පාලන ආයතනවල යටිතල පහසුකම් නගා සිටුවීමේ ප්‍රාග්ධන වැඩසටහන 2016 යටතේ හෙට්ටිපොල මහජන පුස්තකාලය අසල රු.800,000 ක් වටිනා ජංගම වෙළඳ කුටි 04 ක් ඉදිකර 2016 නොවැම්බර් 17 දින ප්‍රාදේශීය සභාවට භාරදී තිබුණි. මෙම වෙළඳ කුටි සුදුසු පරිදි ලබාදීම මගින් ආදායම් උත්පාදනය හා රැකියා අවස්ථා බිහිකරදීමට සභාව විසින් කටයුතු කර නොතිබුණි.

(ඇ) භාණ්ඩ සමීක්ෂණයේදී නිරීක්ෂණය වී ඇති ආකාරයට ලේඛන ගත අහල් 01 ජී.අයි බට 258 න් 36 ක් ඌනතාවයක් තිබියදී ඒවායින් කොටසක් අනාරක්ෂිතව සහා භූමියේ ගොඩගසා තිබුණි.

(ඈ) විධිමත් ආකාරයට භාණ්ඩ ගබඩා කර නොතිබුණු හෙයින් ජල හා විදුලි ගබඩා භෞතිකව පරීක්ෂා කිරීම අසීරු විය.

(ඉ) අනුමත සැලසුම් මත ඉදිකෙරෙන ගොඩනැගිලි වෙනුවෙන් අනුකූලතා සහතික නිකුත් කළ යුතු වුවද 2013 වර්ෂයේ සිට 2017 වර්ෂය දක්වා ලැබී තිබුණු ගොඩනැගිලි අයදුම්පත් 27 ක් සඳහා අනුමැතිය ලබාදී තිබුණද කිසිදු ගොඩනැගිල්ලක් සඳහා අනුකූලතා සහතික නිකුත් කර නොතිබුණි.

(ඊ) 2015 වර්ෂයේදී රු.45,148,811 ක වියදමින් ඉදිකර තිබූ විල්ගමුව ප්‍රාදේශීය සභා ජල ව්‍යාපෘතිය මගින් පාරිභෝගිකයින් 650 කට පමණ ජලය සපයා තිබූ අතර ජල ව්‍යාපෘතියේ ජල මූලාශ්‍රවලින් ලැබෙන ජලය ප්‍රමාණවත් නොවීම හා තාක්ෂණික ගැටලු හේතුවෙන් ජල පාරිභෝගිකයින් සියලුදෙනාගේ ජල අවශ්‍යතා ඉටුකිරීමට නොහැකිවී තිබුණි. මේ හේතුවෙන් සභාවේ ජල බවුසරය යොදා ගෙන අමතර පිරිවැයක් දරමින් ජලය බෙදාහැරීමට සිදුවී තිබුණි. පවතින ජල ව්‍යාපෘතිවල ජල ධාරිතාවය වැඩි කළ හැකි නව ජල මූලාශ්‍ර හඳුනාගැනීමට හා පවතින තාක්ෂණික ගැටළු නිරාකරණය කිරීමට සභාව විසින් අවධානය යොමුකර නොතිබුණි.

(උ) ප්‍රදේශයේ දරුදැරියන්ගේ පරිගණක කුසලතා වර්ධනය කිරීමේ අරමුණින් ආරම්භ කළ "e නැණ පියස" 2017 වර්ෂයේදී ශිෂ්‍යයන් නොමැති වීම හේතුවෙන් වසා දමා තිබුණි. වර්තමානයට යෝග්‍ය පරිදි පාඨමාලා හඳුන්වාදීම තුළින් හා සුදුසු උපදේශකයින් බඳවා ගැනීම තුළින් මෙම ආයතනය තවදුරටත් පවත්වාගෙන යාම කෙරෙහි සභාවේ අවධානය යොමුවී නොපැවතුණි.

(ඌ) පුරනැගුම ව්‍යාපෘතිය යටතේ රු. 15,419,920 ක වටිනාකමින් ඉදිකර විල්ගමුව ප්‍රාදේශීය සභාව වෙත 2016 වර්ෂයේදී ලබාදී ඇති නාමිණිඔය ආදාහනාගාරයේ මෘත දේහ 06 ක් පමණක් දහනය කර තිබූ අතර 2017 දෙසැම්බර් 04 දිනෙන් පසු ක්‍රියාවිරහිත වී තිබුණි. ආදාහනාගාරයේ භාවිතා කරනු ලබන උපකරණ සම්බන්ධයෙන් වගකීම් සහතික ලබාගැනීමට ප්‍රාදේශීය සභාව විසින් කටයුතු කර නොතිබීම හේතුවෙන් ක්‍රියාවිරහිත වීම්වලදී අළුත්වැඩියා කටයුතු කර ගැනීම අපහසු වී තිබුණි.

3.5 වත්කම් කළමනාකරණය

3.5.1 නිෂ්ක්‍රීය/ ඌන උපයෝජිත වත්කම්

සමාලෝචිත වර්ෂය අවසන් වන විට වසර 03 - 10 ක කාල පරාසයකට අයත් වාහන 05 ක් අළුත්වැඩියා කර ප්‍රයෝජනයට ගැනීමට කටයුතුකර නොතිබුණි.

3.5.2 වාහන උපයෝජනය

සභාව සතු රු.5,600,000 ක වටිනාකමකින් යුතු ලොරි රථය 2016 මැයි 06 දිනෙන් පසුව ධාවනයට කර නොතිබුණු අතර මෙම වාහනය සුදුසු පරිදි ආදායම් උත්පාදන කටයුතුවල යෙදවීමට සභාව විසින් අවධානය යොමුකර නොතිබුණි.

3.6 ප්‍රසම්පාදනය

3.6.1 ප්‍රසම්පාදන සැලැස්ම

2006 ප්‍රසම්පාදන මාර්ගෝපදේශ සංග්‍රහයේ 4.2.1 ප්‍රකාරව ප්‍රාදේශීය සභාව විසින් ප්‍රසම්පාදන සැලැස්මක් පිළියෙල කර නොතිබුණු අතර 2017 වර්ෂය තුළ රු.2,095,020 ක මිලදී ගැනීම් ප්‍රසම්පාදන සැලසුමකින් තොරව මිලදී ගෙන තිබුණි.

4 ගිණුම් කටයුතුභාවය හා යහපාලනය

4.1 අයවැය පාලනය

සමාලෝචිත වර්ෂය තුළ ආදායම් හා වියදම් අතර ප්‍රතිපාදන මාරු කිරීමෙන් අනතුරුවද අයවැයගත හා තථ්‍ය ආදායම් වියදම් අතර සැලකිය යුතු විචලනයක් නිරීක්ෂණය වූයෙන් අයවැය ලේඛනය ඵලදායී කළමනාකරණ පාලන කාරකයක් ලෙස යොදාගෙන නොතිබුණු බව නිරීක්ෂණය විය. මේ සම්බන්ධයෙන් පහත කරුණු නිරීක්ෂණය විය.

(අ) ආදායම් විෂයන් 11 කට අදාළව රු.790,000 ක ඇස්තමේන්තුගත ආදායම් කිසිවක් උපයාගෙන නොතිබුණි.

(ආ) ආදායම් විෂයන් 29 ක ඇස්තමේන්තුගත ආදායම් හා තථ්‍ය ආදායම අතර විචලනය සියයට 0 ත් සියයට 305 ත් අතර පරාසයක පැවතුණි.

(ඇ) වැය විෂයන් 79 ක් සඳහා ඇති කළ රු.1,657,000 ක ප්‍රතිපාදනවලින් කිසිදු වියදමක් දරා නොතිබුණි.

(ඈ) වැය විෂයන් 25 කට අදාළව ශුද්ධ ප්‍රතිපාදනය හා තථ්‍ය වියදම අතර සියයට 10 සිට සියයට 100 දක්වා වූ පරාසයක විචලනයන් පැවතුණි.

4.2 අභ්‍යන්තර විගණනය

1988 ප්‍රාදේශීය සභා (මුල්‍ය හා පරිපාලන) රීති 5(7) ප්‍රකාරව අභ්‍යන්තර විගණන ඒකකයක් ස්ථාපිත කර ඇතත් අභ්‍යන්තර විගණන වාර්තා විගණනයට ඉදිරිපත් කර නොතිබුණි.

4.3 විගණන හා කළමනාකරණ කමිටු ක්‍රියාත්මක කිරීම.

---------------------------------------------------------

මධ්‍යම පළාත් ප්‍රධාන අමාත්‍යාංශ ලේකම්ගේ 2014 අගෝස්තු 01 දිනැති සීපීසී/සීඑම්එස්/01/06 අංක දරන චක්‍රලේඛය ප්‍රකාරව වාර්ෂිකව විගණන හා කළමනාකරණ කමිටු 04 ක් පැවැත්විය යුතු වුවත් 2017 වර්ෂයේදී කමිටු වාර 03 ක් හා 2016 වර්ෂයේදී කමිටු වාර 01 ක් පමණක් පවත්වා තිබුණි.

5 පද්ධති හා පාලන

-----------------

විගණනයේදී නිරීක්ෂණය වූ අඩුපාඩු වරින්වර සභාවේ අවධානයට යොමුකර ඇති අතර පහත සඳහන් පද්ධති හා පාලන ක්ෂේත්‍රයන් කෙරෙහි විශේෂ අවධානය යොමු කළයුතුය.

| පද්ධතිය | අඩුපාඩුව |
|---|---|
| (අ) වත්කම් පාලනය | i. ස්ථාවර වත්කම් ලේඛනය යාවත්කාලීන කර නොතිබීම.<br>ii. සියලු වත්කම්වල වටිනාකම් තක්සේරු කර නොතිබීම.<br>iii. නිෂ්ක්‍රීය වත්කම් ප්‍රයෝජනයට ගැනීමට කටයුතු කර නොතිබීම.<br>iv. වාහනවල අයිතිය පවරා ගැනීමට කටයුතු කර නොතිබීම. |
| (ආ) ආදායම් රැස්කිරීම | i. හිඟ ආදායම් අයකර ගැනීමට කටයුතු කර නොතිබීම.<br>ii. වෙළඳ බලපත්‍ර සමීක්ෂණයක් සිදුකර නොතිබීම.<br>iii. තාවකාලික වරිපනම් ගාස්තු අයකර නොතිබීම.<br>iv. අතුරු ව්‍යාවස්ථා පනවා ත්‍රීවීල් රථ නැවතුම්පල වලින් ගාස්තු අයකිරීමට කටයුතු කර නොතිබීම. |
| (ඇ) ගබඩා පාලනය | i. ගබඩා තොග ලේඛන යාවත්කාලීන කර නොතිබීම.<br>ii. යල්පැන ගිය තොග ඉවත් කිරීමට කටයුතු කර නොතිබීම.<br>iii. අනවශ්‍ය තොග රැස්කර තබාගැනීම. |
| (ඈ) ව්‍යාපෘති පාලනය | i. ශක්‍යතා අධ්‍යයන වාර්තා ලබා නොගැනීම.<br>ii. නව ඉදිකිරීම් ඵලදායී කාර්යයන්ට යොදා ගැනීමට කටයුතු නොකිරීම. |